# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

### (2010 මැයි / ජූනි)

### සමාජීය විද්‍යා පීඨය

### ඉතිහාසය- HIST –E2025

### ඉන්දියාවේ ඉතිහාසය (ක්‍රි. ව. 1526 - 1947)

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය : පැය 03 යි**

---

01. "දහසය වන සියවස ආරම්භයේ ඉන්දියාවේ පැවති අස්ථාවර දේශපාලන තත්ත්වය බාබුර්ගේ ජයග්‍රහණ සඳහා බෙහෙවින්ම ඉවහල් විය" සාකච්ඡා කරන්න.

02. "මෝගල් බලය තහවුරු කිරීමෙහි ලා හුමායූන් ඉමහත් මෙහෙයක් ඉටු කළේය." සාකච්ඡා කරන්න.

03. ෂේර් ෂාගේ කාර්ය සාඵල්‍යය අගය කරන්න.

04. අක්බාර් අධිරාජයාගේ පරිපාලන ප්‍රතිපත්ති පිළිබඳව විමර්ශනයක් කරන්න.

05. 18 වන සියවසේ මැදභාගයේ දී ප්‍රංශයන් සහ ඉංග්‍රීසීන් අතර ඉන්දියාවේ ඇති වූ බල අරගලයේ ප්‍රධාන අවස්ථා පැහැදිලි කොට එහි ප්‍රතිඵල සමාලෝචනය කරන්න.

06. ඉන්දියාවේ ඉංග්‍රීසි බලය ව්‍යාප්ත කිරීම සඳහා උපකාරක ගිවිසුම් ක්‍රමය යොදාගත් ආකාරය පැහැදිලි කරන්න.

07. "ඩැල්හවුසි සාමිවරයාගේ ක්‍රියාකලාපය ඉංග්‍රීසි බලය ඉන්දියාවේ තහවුරු කිරීම සඳහා උපයෝගී වුව ද, එහි පරිහානිය සඳහා ද එය ඉවහල් විය. " සාකච්ඡා කරන්න.

08. "සිපෝයි කැරැල්ල" ඉන්දියාවේ නිදහස් අරගලයක් ලෙස සැලකිය හැකිදැයි පරීක්ෂා කරන්න.

09. ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න.

10. පහත දක්වෙන මාතෘකාවලින් <u>දෙකක් (02)</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.
    i. රාණා සංග්‍රාම් සිං
    ii. වොරන් හේස්ටිංස්
    iii. ආර්ය සමාජ්
    iv. මහත්මා ගාන්ධි
    v. සුභාෂ් චන්ද්‍රබෝෂ්

*****************************